මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

முஸ்லிம் சமய பண்பாட்டு அலுவல்கள் திணைக்களம்

**DEPARTMENT OF MUSLIM RELIGIOUS AND CULTURAL AFFAIRS**

# කාර්ය සාධන වාර්තාව - 2018
# முன்னேற்ற அறிக்கை – 2018
# Annual Performance Report – 2018



**වැය ශීර්ෂය - 202**

**செலவினத் தலைப்பு – 202**

**Expenditure Head - 202**

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

අංක 180, ටී.බී. ජායා මාවත,

කොළඹ 10.

««««««««««««««««««««««««««««★»»»»»»»»»»»»»»»»»»»»»»»»»»»»

## දැක්ම

ශ්‍රී ලංකාව තුල
ඉස්ලාමීය ආගමික සාරධර්ම හා සංස්කෘතික
වටිනාකම් අතින් පිරිපුන්
ඉතා උසස් මුස්ලිම්
ජන සමාජයක්.

## මෙහෙවර

ශ්‍රී ලාංකික මුස්ලිම් ජන සමාජයේ
උන්නතිය සහ යහ පැවැත්ම උදෙසා
සියලු කාර්යයන්
මැනවින් සංවිධානය කිරීම,
මුස්ලිම් ආගමික හා සංස්කෘතික ආයතන
සම්බන්ධීකරණය හා මෙහෙයවීම
සහ
වකුෆ් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම මගින්
ඉතා උසස් මුස්ලිම් ජන සමාජයක්
බිහි කිරීමට උරදීම.

## පටුන


| | | පිටු අංක |
|---|---|---|
| 1. | හැඳින්වීම | 01 |
| 2. | දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යභාරය | 01 - 03 |
| 3. | සංවිධාන ව්‍යුහය | 03 - 04 |
| 4. | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල විස්තර | 05 |
| | 4.1 අනුමත කාර්ය මණ්ඩලය | |
| | 4.2 වර්ෂය තුළ කාර්ය මණ්ඩල වෙනස්වීම් | |
| 5. | පරිපාලන හා සංවර්ධන අංශය මගින් ඉටු කරන ලද කාර්යයන් | 06 - 09 |
| | 5.1 පරිපාලන ශාඛාව මගින් ඉටු කරන ලද කාර්යයන් | |
| | 5.1.1 පුහුණු වැඩසටහහන් | |
| | 5.1.2 විදේශීය පුහුණු වැඩසටහන් | |
| | 5.2 සංවර්ධන ශාඛාව මගින් ඉටු කරන ලද කාර්යයන් | |
| 6. | මූල්‍ය අංශය මගින් ඉටු කරන ලද කාර්යයන් සහ මූල්‍ය වාර්තා | 09 - 11 |
| | 6.1 මූල්‍ය අංශය මගින් ඉටුකරන ලද කාර්යයන් | |
| | 6.2 මූල්‍ය වාර්තා | |
| | 6.2.1 පුනරාවර්තන | |
| | 6.2.2 මූලධන | |
| | 6.2.3 අත්තිකාරම් ගිණුම් | |
| 7. | ආගමික හා සංස්කෘතික කටයුතු අංශය මගින් ඉටු කරන ලද කාර්යයන්. | 12 - 16 |
| 8. | වකූෆ් හා පල්ලි පරිපාලන අංශය මගින් ඉටු කරන ලද කාර්යයන්. | 16 - 17 |
| 9. | ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන් | 17 |
| 10. | අභ්‍යන්තර විගණන හා විමර්ෂන අංශය මගින් ඉටු කරන ලද කාර්යයන් | 17 |
| **11.** | දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි වූ බාධාවන් සහ දුෂ්කරතා | 18 |

## 01. හැඳින්වීම

**තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු** අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් මුස්ලිම් ආගමික කටයුතු හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය සඳහා කටයුතු කරයි. ශ්‍රී ලංකාව තුල ඉස්ලාමීය ආගමික සාරධර්ම හා සංස්කෘතික වටිනාකම් අතින් පිරිපුන් ඉතා උසස් මුස්ලිම් ජන සමාජයක් ඇති කිරීමේ "දැක්ම" පෙරදැරිව මුස්ලිම් ජන සමාජයේ උන්නතිය සහ යහපැවැත්ම උදෙසා සමස්ත කාර්යභාරය නියාමනය කිරීමේ වගකීමට මෙම දෙපාර්තමේන්තුව උරදරා සිටී.

1962 අංක 21 හා 1982 අංක 33 දරන පනත් මගින් සංශෝධිත 1956 අංක 51 දරන වකුෆ් පනතින් අරමුණු කරගත් කාර්යභාරයන් ඉටුකිරීමෙහිලා ස්ථාපනය කර ඇති ශ්‍රී ලංකා වකුෆ් සභාව හා වකුෆ් විනිශ්චය සභාව යන ආයතනයන් සමඟ මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් වකුෆ් පනතේ අරමුණු ප්‍රකාර මුස්ලිම් පල්ලි, සිද්ධස්ථාන හා ආගමික ආයතන ලියාපදිංචි කිරීම, ලියාපදිංචි මුස්ලිම් ආගමික ස්ථානවල හා මුස්ලිම් පුණ්‍යාභාරවල හෝ වකුෆ් භාරවල භාරකරුවන්ගේ බලතල, කාර්ය හා කර්තව්‍ය නියම කිරීම, මුස්ලිම් පුණ්‍යාභාර අරමුදල් පවත්වාගෙන යාම යන කරුණු මැනවින් ඉටුවන අයුරින් පරිපාලන කටයුතු දියත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය තුල අන්තර්ගත වී ඇත. වකුෆ් පනතින් විධිවිධාන සලසන ලද පරිපාලන ක්‍රියාකාරකම් ආවරණය කරමින්, මුස්ලිම් ආගමික හා සංස්කෘතික අනන්‍යතාවය සුරක්ෂණයට අවශ්‍ය පියවර ගනිමින් ජන සමාජයේ යහපත උදෙසා සුභසාධක පහසුකම් සැලසීම සඳහා වන සියළු කටයුතු ක්‍රියාත්මක කරයි.

## 02. දෙපාර්තමේන්තුවේ අරමුණු හා කාර්යභාරය

### 2.1 අරමුණු :

1. මුස්ලිම් පල්ලි, පුණ්‍ය භාර අරමුදල හා ඒවායේ වත්කම් පාලනය හා මෙහෙයවීම.
2. ඉස්ලාම් ආගමික ආයතන හා ඒවායේ වත්කම් පාලනය හා මෙහෙයවීම.
3. ඉස්ලාමීය ආගමික අධ්‍යාපනය පෝෂණය කිරීම හා වර්ධනය කිරීම.
4. ඉස්ලාමීය සංස්කෘතික අංග/ කටයුතු පෝෂණය කිරීම හා වර්ධනය කිරීම.
5. හජ් වන්දනාකරුවන් සඳහා පහසුකම් හා සේවා සම්පාදනය කිරීම.
6. ඉස්ලාම් ආගමික කටයුතු හා සංස්කෘතික ක්ෂේත්‍රයන් හි සමාජ මෙහෙවරක් ඉටුකරනු ලැබූවන්ගේ මෙහෙය ඇගයීමට පාත්‍ර කිරීම.
7. ඉස්ලාම් ආගමික ශික්ෂණයන් ඉටුකිරීම සඳහා (පස්වේල් නමස්කාර කිරීම සහ රාමසාන් උපවාසය වැනි) අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරීම.
8. කාලීන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ මාර්ගෝපදේශ ලබාදීම.
9. මුස්ලිම් ජන සමාජයේ එකමුතු බව පවත්වාගෙන යාම සහ ජාතික ඒකාබද්ධතාව සඳහා ක්‍රියාකිරීම.

## 2.2 දෙපාර්තමේන්තු කාර්යභාරය

1. මුස්ලිම් පල්ලි ඇතුළු ආගමික ස්ථාන ලියාපදිංචිය සහ භාරකරුවන් පත්කිරීම.

2. මුස්ලිම් පුණ්‍ය භාර අරමුදල පවත්වාගෙන යාම සහ වකුෆ් පනත ක්‍රියාත්මක කිරීම.

3. ලියාපදිංචි කරන ලද මුස්ලිම් දේවස්ථාන, අහදියා (දහම් පාසල්), අරාබි විදුහල්, කුර්ආන් මද්රසා ඇතුළු ආගමික ආයතන සංවර්ධනය කිරීම සඳහා මූල්‍ය ආධාර ලබාදීම.

4. ශුද්ධ වූ රාමසාන් මාසයේ ආරම්භය සහ සමාප්තිය නිවේදනය කිරීම සහ "රාමසාන්" මාසය වෙනුවෙන් විදේශ මුස්ලිම් රටවල්වලින් මෙරටට ප්‍රදානය කරනු ලබන රටඉඳි දිස්ත්‍රික් මට්ටමින් අදාල ප්‍රධාන දේවස්ථාන හරහා දිවයින පුරා සිටින මුස්ලිම් ජනතාවට බෙදාහැරීම.

5. ජාතික මීලාදුන් නබි දිනය සනිටුහන් කරමින් සෑම වසරක් පාසාම දිවයිනේ එක් දිස්ත්‍රික්කයක් තෝරාගෙන එම දිස්ත්‍රික්කය පුරා ආගමික හා සමාජයීය සංවර්ධනය ඇති කිරීම. එහිදී අදාල ප්‍රදේශය මුස්ලිම් දේවස්ථාන, ආගමික ආයතන, මුස්ලිම් සහ මුස්ලිම් නොවන පාසල්වල සංවර්ධන කටයුතු සිදුකිරීම, තරඟ හා ත්‍යාග ප්‍රදානෝත්සව සංවිධානය කිරීම, ආගමික පුරෝගාමීන්ට ගෞරවාචාරය පුදකිරීම, අදාල ප්‍රදේශයේ ඓතිහාසික වැදගත්කම පිළිබඳ පොත් ප්‍රකාශනය යනාදී ක්‍රියාකාරකම් සිදුකෙරේ.

6. ශ්‍රී ලාංකික මුස්ලිම් ජනතාව ශුද්ධ වූ හජ් වන්දනාවෙහි යෙදීම සඳහා පහත පරිදි අවශ්‍ය කටයුතු සලසාදීම.
   - ❖ සුදුසු නියෝජිතයන් ලියාපදිංචිය සහ බලපත්‍ර නිකුත් කිරීම.
   - ❖ වැඩසටහන පිළිබඳව වන්දනාකරුවන් දැනුවත් කිරීම.
   - ❖ හජ් වන්දනාව පිළිබඳ මාර්ගෝපදේශන පොත් බෙදාහැරීම.
   - ❖ වන්දනාකරුවන් සඳහා ගුවන් ප්‍රවාහන කටයුතු සංවිධානය.
   - ❖ හජ් වන්දනාව සඳහා සෞදි අරාබි රාජධානියේ රැඳී සිටින කාලය තුල වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් සැලසීම සහ මාර්ගෝපදේශ ලබා දීම.
   - ❖ හජ් වන්දනා කාලය තුල වන්දනාකරුවන් සඳහා වෛද්‍ය සේවා කටයුතු සලසාදීම.
   - ❖ බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළේදී සහ ජිද්දා අන්තර්ජාතික ගුවන්තොටුපළේදී හජ් වන්දනාකරුවන්ට මගපෙන්වීම සහ අවශ්‍ය පහසුකම් සලසාදීම.
   - ❖ සෞදි අරාබි රාජධානියේදී හජ් නියෝජිතයින් සලසන සේවාවන් නිරීක්ෂණය කිරීම සහ අඩුපාඩු නිවැරදි කිරීම.
   - ❖ සෞදි අරාබි හජ් අමාත්‍යාංශය සමඟ කටයුතු සම්බන්ධීකරණය

7. දිවයින පුරා අහදියා දහම් පාසල් ගුරුභවතුන් සඳහා නිල ඇඳුම්, පුස්තකාල පොත් දීමනා ලබාදීම, දහම් පාසල් ගුරුභවතුන් සඳහා පුහුණු පාඨමාලා පැවැත්වීම සහ අහදියා දහම් පාසල් සඳහා විෂය නිර්දේශයක් හඳුන්වාදීම, පොත් මුද්‍රණය හා බෙදා හැරීම

8. මුස්ලිම් සුභසාධන සමිති ලියාපදිංචිය සහ එම කටයුතු පවත්වාගෙන යාමට දායකවීම.

9. කලාකරුවන්ට ගෞරව සත්කාර දැක්වීම පිණිස වාර්ෂිකව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන කලාභූෂණ සම්මාන උළෙල සඳහා සුදුසු කලාකරුවන් නිර්දේශ කිරීම.

10. මුස්ලිම් කතුවරුන් දෛර්යමත් කිරීම සඳහා ඔවුන් විසින් නිර්මාණය කරන ලද පොත් පත් මිලදී ගෙන මුස්ලිම් පාසල් පුස්තකාලවලට බෙදාහැරීම.

11. පල්ලි දායක සභා සාමාජිකයන්ට ඉස්ලාම් ආගමික ආයතනවල පරිපාලන සභා සාමාජිකයන්ට පුහුණුවක් ලබාදීම.

12. අන්තර්ජාතික තරඟ සඳහා (අල්කුර්ආනය පාරායණය කිරීම) අපේක්ෂකයින් තේරීම. මෙම තරඟ වාර්ෂිකව ඊජිප්තුව, තුර්කිය, මැලේසියාව සහ ඩුබායි යන විදෙස් රටවල්වලදී පැවැත්වේ.

13. ඉස්ලාමීය උසස් අධ්‍යාපන කටයුතු සඳහා සිසුන් තේරීම.


14. ඉස්ලාම් ආගමික පූජකවරුන් (මවුලවිවරු) සඳහා විශේෂ හැඳුනුම්පත් ලබාදීම.

## 03. සංවිධාන ව්‍යුහය

ඉහත කාර්යභාරය සාධනය උදෙසා ප්‍රධාන අංශ 05කින් සමන්විත වන අයුරින් මෙම දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය සකස්කර ඇති අතර, අදාල අංශ පහත සඳහන් පරිදි වේ.

1. පරිපාලන හා සංවර්ධන අංශය
2. මූල්‍ය අංශය
3. ආගමික හා සංස්කෘතික කටයුතු අංශය
4. වකුෆ් අංශය
5. අභ්‍යන්තර විගණන හා විමර්ශන අංශය

# සංවිධාන ව්‍යුහය
## මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව



## 04.දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල විස්තර

### 4.1 අනුමත කාර්ය මණ්ඩලය

දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය තුල අනුමත කාර්ය මණ්ඩලය 123 ක් වන අතර, 2018.12.31 දිනට අදාල කාර්ය මණ්ඩල විස්තර පහත දැක්වේ.

| අනු. අංකය | තනතුර | අනුමත තනතුරු සංඛ්‍යාව | සේවයේ නියුතු සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| | | | ස්ථිර | අනියම් | |
| 01 | අධ්‍යක්ෂ | 01 | 01 | - | 0 |
| 02 | ගණකාධිකාරී | 01 | 01 | - | 0 |
| 03 | අභ්‍යන්තර විගණක (ශ්‍රී.ලං.ග.සේ.) | 01 | - | - | 01 |
| 04 | නියෝජ්‍ය /සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ.) | 04 | 02 | - | 02 |
| 05 | නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ.නොවන) | 02 | 0 | - | 02 |
| 06 | පරිපාලන නිලධාරී | 01 | 0 | - | 01 |
| 07 | භාෂා පරිවර්තක (සිං/දෙ) | 01 | 0 | - | 01 |
| 08 | වකුෆ් මණ්ඩල ලේකම් | 01 | 0 | - | 01 |
| 09 | වකුෆ් විනිශ්චය සභා ලේකම් | 01 | 0 | - | 01 |
| 10 | විමර්ශන නිලධාරී | 02 | 0 | - | 02 |
| 11 | සංස්කෘතික නිලධාරී | 03 | 03 | - | 0 |
| 12 | සංස්කෘතික සහකාර | 15 | 09 | - | 06 |
| 13 | පුණ්‍යාධාර සහකාර | 01 | 01 | - | 0 |
| 14 | සංවර්ධන නිලධාරී | 50 | 39 | - | 11 |
| 15 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 22 | 20 | - | 02 |
| 16 | රියදුරු | 04 | 03 | - | 01 |
| 17 | කා.කා.ස. | 13 | 11 | | 02 |
| | **එකතුව** | **123** | **90** | | **33** |

### 4.2 වර්ෂය තුළ කාර්ය මණ්ඩල වෙනස්වීම්

**2018 වර්ෂය තුළ කාර්ය මණ්ඩල වෙනස්වීම්**

| | | |
|---|---|---|
| ස්ථාන මාරුවීම් | පැමිණීම් | 08 |
| | පිටවීම් | 10 |
| පත් කිරීම් | ස්ථිර | 04 |
| | අනියම් | - |
| උසස් කිරීම් | - | |
| සේවයෙන් පහ කිරීම් | - | |
| තනතුරු අතහැර යාම් | - | |
| ඉල්ලා අස්වීම් | - | |
| විශ්‍රාම ගැනීම් | 01 | |
| මිය යෑම් | - | |
| වෙනත් (රා.සේවයේ වෙනත් තනතුරු සඳහා මුදාහැරීම් | 01 | |

## 05. පරිපාලන හා සංවර්ධන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්

### 5.1 පරිපාලන ශාඛාව මඟින් ඉටු කරන ලද කාර්යයන්

දෙපාර්තමේන්තුවට අයත් සියළුම තනතුරු හා සේවාවන්ට අයත් පත් කිරීමේ සිට විශ්‍රාම යාම දක්වා වූ ස්ථාන මාරු කිරීම්, උසස් කිරීම්, විනය කටයුතු සේවා දිර්ඝ කිරිම ආදි රාජකාරි කටයුතු තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය හා රාජ්‍ය සේවා කොමිෂන් සභාව යන ආයතන අවශ්‍ය පරිදි සම්බන්ධීකරණය කර ගනිමින් සිදු කිරිම.

- ❖ දෙපාර්තමේන්තුවට අදාල බඳවා ගැනීමේ පරිපාටි සකස් කර, නිර්දේශ ලබා ගැනීම සහ අනුමැතිය පිණිස ඉදිරිපත් කිරීම.
- ❖ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම.
- ❖ තැපැල.
- ❖ දේශීය හා විදේශීය නිවාඩු සම්බන්ධ කටයුතු.
- ❖ දුම්රිය බලපත්‍ර / දුම්රිය අනුග්‍රහ වාරප්‍රවේශපත්‍ර සම්බන්ධ කටයුතු.
- ❖ වාහන නඩත්තුව සහ ප්‍රවාහන පහසුකම් සැපයීම/ උපදේශක කාරක සභා සඳහා පිළිතුරු සැපයීම.
- ❖ මැතිවරණ රාජකාරි කටයුතු.
- ❖ පුහුණු වැඩසටහන් සැලසුම් කිරිම හා ඒ සඳහා යොමු කිරිම.
- ❖ පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිම.
- ❖ කාර්යාල උපකරණ නඩත්තු කටයුතු.
- ❖ කාර්යාල ගොඩනැගිලි නඩත්තු කටයුතු.
- ❖ අග්‍රහාර රක්ෂණ කටයුතු.
- ❖ ණය අත්තිකාරම් අනුමත කිරිම.

#### 5.1.1 පුහුණු වැඩසටහහන්

**<u>2018 වර්ෂයේදී මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තු නිලධාරින් සහභාගී වූ දේශීය පුහුණු වැඩසටහන්</u>**

2018 වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා ප්‍රතිපාදන - රු.300,000.00
2018 වර්ෂයේ පුහුණු වැඩසටහන් සඳහා වියදම - රු.299,623.00

| අනු අංකය | පුහුණු වැඩසටහනේ නම | පවත්වන ලද ආයතනය | සහභාගී වූ නිලධාරින් සංඛ්‍යාව | කාලය (දින) |
|---|---|---|---|---|
| 1 | නායකත්ව පුහුණුව, ආකල්ප හා කුසලතා වර්ධනය | MRCA | 90 | 01 |
| 2 | නායකත්ව පුහුණුව, ආකල්ප හා කුසලතා වර්ධනය (Refreshments & Other Expenditure) | MRCA | 01 | 01 |
| 3 | Enhancing Skills of Drivers | Skills Develpoment Fund Limited | 2 | 02 |
| 4 | Certificate in English for Junior Executives | Miloda Academy of Financial Studies | 2 | 06 Months |

| | | | | |
|---|---|---|---|---|
| 5 | Certificate course in Public Procurement Procedures | Skills Develpoment Fund Limited | 1 | 10 days from |
| 6 | Office Management for Higher Productivity (Course Fee) | National Institute of Labour Studies | 45 | 02 |
| 7 | Office Management for Higher Productivity (Refeshment & Other Expenditure) | National Institute of Labour Studies | 45 | 02 |
| 8 | Attitude & Professional Development of Drivers | Skills Develpoment Fund Limited | 1 | 02 |
| 9 | Ethics & Disciplines for Drivers & Minor Staff | Skills Develpoment Fund Limited | 3 | 02 |
| 10 | Productivity Improvement | MRCA | 48 | 01 |

### 5.2 සංවර්ධන ශාඛාව මගින් ඉටු කරන ලද කාර්යයන්


**මේ යටතේ ප්‍රධාන වැඩසටහන් 02 ක් ක්‍රියාත්මක කරන ලදි.**

- ❖ දිවයින පුරා ආගමික ස්ථාන සංවර්ධන වැඩසටහන.
- ❖ ජාතික මීලාදුන් නබි සංවර්ධන වැඩසටහන ( මන්නාරම දිස්ත්‍රික්කය).

උක්ත සංවර්ධන වැඩසටහන් මගින් මුස්ලිම් පල්ලි, දහම් පාසල්, අරාබි විදුහල්, කුර්ආන් මද්රසා සහ අනෙකුත් ආගමික ස්ථානයන් සංවර්ධනය කිරීම් හා වැඩිදියුණු කිරීම් කරන ලදි. ප්‍රාග්ධන වියදම් යටතේ මෙම දෙපාර්තමේන්තුවට වෙන් කර ඇති ප්‍රතිපාදන වලින් මෙම සංවර්ධන වැඩසටහන් සඳහා පහත පරිදි මුදල් ප්‍රතිපාදන වෙන් කර ඇත.

**2018 සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇති ආකාරය**


| සංවර්ධන වැඩසටහන | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන ( රු. මිලියන) |
|---|---|
| ආගමික ස්ථාන සංවර්ධන වැඩසටහන ( දිවයින පුරා) | 25 |
| ජාතික මීලාදුන් නබි සංවර්ධන වැඩසටහන | 20 |



### දිවයින පුරා පිහිටි ආගමික ස්ථාන සංවර්ධන වැඩසටහන


| ආගමික ස්ථානය | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලියන) | ඉලක්කගත දේවස්ථාන ගණන | 2018.12.31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | භෞතික | මූල්‍ය (රු.මිලියන) |
| 1. මුස්ලිම් පල්ලි | 17.18 | 99 | 99 | 14.14 |
| 2. අරාබි විදුහල් | 2.7 | 06 | 06 | 2.7 |
| 3. අහදියා දහම් පාසල්, හිෆ්ලුල් කුර්ආන් මද්රසා සංවර්ධනය | 1.3 | 07 | 07 | 1.3 |

**දිස්ත්‍රික්ක මට්ටමින් ආගමික ස්ථාන සංවර්ධනය කළ ආකාරය පහත දැක් වේ.**




**වාර්ෂික මිලාද් සංවර්ධන වැඩසටහන සංවිධානය සහ ක්‍රියාත්මක කිරීම**

2018 වර්ෂයේදි මෙම වැඩසටහන මාන්නාරම දිස්ත්‍රික්කය තෝරාගෙන ක්‍රියාත්මක කල අතර ඒ සඳහා රු. මිලියන 20ක් වෙන්කර ඇති අතර පහත දැක්වෙන පරිදි සංවර්ධන කටයුතු සිදු කරන ලදි. මෙම සංවර්ධන වැඩසටහන සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් ප්‍රතිපාදන වෙන්කර ලද ආකාරය පහතින් දක්වා ඇත.




❖ සංවර්ධන වැඩසටහන් වලට අදාල ප්‍රගති වාර්තා නිසි කලට අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරිම.

## *06.* මුල්‍ය අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන් සහ වාර්තා

### 6.1 මුල්‍ය අංශය මඟින් ඉටුකරන ලද කාර්යයන්

- ❖ වාර්ෂික ඇස්තමේන්තුව සකස් කිරිම.
- ❖ වාර්ෂික විසර්ජන ගිණුම සැකසීම.
- ❖ ගබඩා කලමණාකරනය.
- ❖ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් B ගිණුම් කටයුතු.
- ❖ වවුචර සඳහා ගෙවීම් කටයුතු.
- ❖ වැටුප් හා දීමනා ගෙවීම හා ගිණුම්ගත කිරිම.
- ❖ මුල්‍ය පොත්, ලෙජර හා ලේඛන පවත්වාගෙන යාම.
- ❖ චෙක්පත් නිකුත් කිරිම.
- ❖ මාසික ගිණුම් සාරාංශ සැකසීම.
- ❖ භාණ්ඩාගාරය, විගණකාධිපති, අමාත්‍යාංශය වෙත ගිණුම් ප්‍රකාශ ඉදිරිපත් කිරිම.

### 6.2 මුල්‍ය වාර්තා

**6.2.1** පුනරාවර්තන (පිටු අංක - 10)

**6.2.2** මූලධන (පිටු අංක - 11)

**6.2.3** අත්තිකාරම් ගිණුම් (පිටු අංක - 11)

**<u>පුනරාවර්තන වියදමේ මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර විචලනතා - 2018</u>**

දෙපාර්තමේන්තුවේ නම: මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු

වියදම් ශීර්ෂ අංකය : 202

| වැඩසටහන් අංකය | ව්‍යාපෘති අංකය | උප ව්‍යාපෘති අංකය | වැය විෂය අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | පුනරාවර්තන වියදම්වල විස්තරය | ශුද්ධ ප්‍රතිපාදන රු. | සත්‍ය වියදම රු. | ඉතිරිය රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | **<u>පුද්ගල පඩි නඩි</u>** | | | |
| 2 | 1 | 0 | 1001 | 11 | **වැටුප් හා වේතන** | 30,500,000 | 30,487,704 | **12,296** |
| 2 | 1 | 0 | 1002 | 11 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,630,000 | 1,499,344 | ***130,656** |
| 2 | 1 | 0 | 1003 | 11 | වෙනත් දීමනා | 12,999,000 | 12,978,357 | **20,643** |
| | | | | | **<u>ගමන් වියදම්</u>** | | | |
| 2 | 1 | 0 | 1101 | 11 | දේශීය | 1,065,000 | 979,716 | ***85,284** |
| 2 | 1 | 0 | 1102 | 11 | විදේශීය | 1,229,000 | 1,228,885 | **115** |
| | | | | | **<u>සැපයීම්</u>** | | | |
| 2 | 1 | 0 | 1201 | 11 | ලිපි ද්‍රව්‍ය | 1,700,000 | 1,596,791 | ***103,209** |
| 2 | 1 | 0 | 1202 | 11 | ඉන්ධන | 979,000 | 973,934 | **5,066** |
| 2 | 1 | 0 | 1203 | 11 | ආහාර පාන හා නිල ඇඳුම් | 132,000 | 130,410 | **1,590** |
| | | | | | **<u>නඩත්තු වියදම්</u>** | | | |
| 2 | 1 | 0 | 1301 | 11 | වාහන | 906,000 | 905,386 | **614** |
| 2 | 1 | 0 | 1302 | 11 | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 410,000 | 406,552 | **3,448** |
| 2 | 1 | 0 | 1303 | 11 | ගොඩනැගිලි සහ ඉදි කිරීම් | 200,000 | 195,212 | **4,788** |
| | | | | | **ගිවිසුම්ගත සේවා** | | | |
| 2 | 1 | 0 | 1401 | 11 | ප්‍රවාහන වියදම් | 257,600 | 257,554 | **46** |
| 2 | 1 | 0 | 1402 | 11 | **සංදේශන** | 892,400 | 892,159 | **241** |
| 2 | 1 | 0 | 1403 | 11 | විදුලිය හා ජලය | 5,053,000 | 5,052,063 | **937** |
| 2 | 1 | 0 | 1404 | 11 | දේශීය බදු හා කුලී ගාස්තු | 172,000 | 171,112 | **888** |
| | | | | | **සේවා** | | | |
| 2 | 1 | 0 | 1409-1 | 11 | රටඉදි නිදහස් කිරීම හා ප්‍රවාහන වියදම් | 21,000,000 | 18,167,402 | **2,832,598** |
| 2 | 1 | 0 | 1409-2 | 11 | අහදියා දහම් පාසල් ජාතික විභාගය | 3,000,000 | 1,797,743 | ***1,202,257** |
| 2 | 1 | 0 | 1409-3 | 11 | වෙනත් | 130,500,000 | 129,857,554 | ***642,446** |
| 2 | 1 | 1 | 1501 | 11 | දහම් පාසල් ගුරුවරුන්ගේ නිල ඇඳුම් දීමනා | 7,000,000 | 202,169 | ***6,797,831** |
| 2 | 1 | 2 | 1501 | 11 | **පුස්තකාල පොත් දීමනාව** | 21,200,000 | 20,065,000 | ***1,135,000** |
| 2 | 1 | 3 | 1501 | 11 | **දහම් පාසල් පොත් සැකසීම හා මුද්‍රණය** | 6,000,000 | 4,892,527 | ***1,107,474** |
| | | | | | **මාරු කිරීම්** | | | |
| 2 | 1 | 0 | 1506 | 11 | දේපළ ණය පොළී | 75,000 | 73,576 | **1,424** |
| 2 | 1 | 8 | 1508 | 11 | පොදු ආයතන | 1,200,000 | 978,000 | ***222,000** |
| 2 | 1 | 0 | 1701 | 11 | පාඩු සහ කපා හැරීම් | 100,000 | 0 | **100,000** |

* 2018 වර්ෂයේ අතැති බිල්පත් වලට ගෙවීම් කිරීමට අක් මුදල් නොලැබීමෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත.

## <u>මූලධන වියදමේ මුළු ශුද්ධ ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර විචල්‍යතා - 2018</u>

දෙපාර්තමේන්තුවේ නම: මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු          වියදම් ශීර්ෂ අංක : 202

| වැඩසටහන් අංකය | ව්‍යාපෘති අංකය | උප ව්‍යාපෘති අංකය | වැය විෂය අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | මූලධන වියදම්වල විස්තර | ශුද්ධ ප්‍රතිපාදන රු. | සත්‍ය වියදම රු. | ඉතිරිය රු. |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | **<u>මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම</u>** | - | | |
| 2 | 1 | 0 | 2001 | 11 | **ගොඩනැගිලි හා ඉදිකිරීම්** | 300,000 | 220,490 | *79,510 |
| 2 | 1 | 0 | 2002 | 11 | **යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ** | 250,000 | 154,716 | *95,284 |
| 2 | 1 | 0 | 2003 | 11 | වාහන | 450,000 | 357,690 | *92,310 |
| | | | | | **<u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u>** | | | |
| 2 | 1 | 0 | 2102 | 11 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීයය උපකරණ | 1,200,000 | 1,199,919 | 81 |
| 2 | 1 | 0 | 2103 | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 12,000,000 | 1,476,605 | 10,523,395 |
| 2 | 1 | 1 | 2106 | 11 | මෘදුකාංග සංවර්ධනය | 200,000 | 200,000 | 0 |
| | | | | | **<u>මානව සම්පත් සංවර්ධනය</u>** | | | |
| 2 | 1 | 0 | 2401 | 11 | කාර්ය මණ්ඩල පුහුණු | 300,000 | 299,623 | 377 |
| | | | | | **<u>වෙනත් මූලධන වියදම් හා වෙනත් ආයෝජන</u>** | | | |
| 2 | 1 | 6 | 2104 | 11 | ජාතික මීලාද් සංවර්ධන වැඩ සටහන- දහම් පාසල් සඳහා පහසුකම් සැපයීම(ගොඩනැගිලි හා ඉදිකිරීම්) | 20,000,000 | 19,512,170 | 487,830 |
| 2 | 1 | 7 | 2506 | 11 | මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථාන ඉදිකිරීම හා පල්ලි වැඩිදියුණු කිරීම | 25,000,000 | 24,280,639 | 719,361 |

* 2018 වර්ෂයේ අතැති බිල්පත් වලට ගෙවීම් කිරීමට ප්‍රමාණවත් අක් මුදල් නොලැබීමෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත.

## <u>අත්තිකාරම් ගිණුම් සහ තැන්පත් ගිණුම් සඳහා වූ පාලන ගිණුම්වල සාරාංශය - 2018</u>

වියදම් ශීර්ෂ අංකය: 202          දෙපාර්තමේන්තුවේ නම: මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු

| අත්තිකාරම් / තැන්පත් ගිණුමේ නම | ගිණුම් අංකය* | දෙපාර්තමේන්තුවේ පොත් අනුව | | | | භාණ්ඩාගාර පොත් අනුව 2018/12/31 දිනට ශේෂය |
|---|---|---|---|---|---|---|
| | | 2018/01/01 දිනට ආරම්භක ශේෂය | වර්ෂය තුළ හර කිරීම් | වර්ෂය තුළ බැර කිරීම් | 2018/12/31 දිනට අවසාන ශේෂය | |
| | | රු. | රු. | රු. | රු. | රු. |
| I. රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් | 202011 | 8,017,427.00 | 3,058,509.00 | 2,162,476.00 | 8,913,460.00 | 8,913,460.00 |
| | 202012 | | 1,482,546.00 | 1,222,294.00 | 260,252.00 | 260,252.00 |
| | | 8,017,427.00 | 4,541,055.00 | 3,384,770.00 | 9,173,712.00 | 9,173,712.00 |
| II. අනෙකුත් අත්තිකාරම් | | | | | | |
| III විවිධ අත්තිකාරම් | | | | | | |
| IV තැන්පත් (i) පොදු තැන්පත් | 6000/0016/0094 | 17,415,648.00 | | | 17,415,648.00 | 17,415,648.00 |
| | 6000/0002/0148 | 0.00 | 0.00 | 0.00 | 0.00 | 0.00 |
| | 6000/0018/0097 | 622,202.00 | 862,496.00 | 888,795.00 | 595,903.00 | 595,903.00 |
| (ii) අනෙකුත් තැන්පත් | | | | | | |



*

## 07 ආගමික හා සංස්කෘතික කටයුතු අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්.

- ❖ අරාබි විදුහල් ලියාපදිංචි කිරීම, විෂය නිර්දේශ සැකසීම හා එහි පරිපාලන කටයුතු.
- ❖ හිෆ්ලුල් කුර්ආන් මද්රසා ලියාපදිංචි කිරීම, විෂය නිර්දේශ සැකසීම හා එහි පරිපාලන කටයුතු.
- ❖ කුර්ආන් මද්රසා ලියාපදිංචි කිරීම, විෂය නිර්දේශ සැකසීම හා එහි පරිපාලන කටයුතු.
- ❖ අහදියා දහම් පාසල් ලියාපදිංචි කිරීම, විෂය නිර්දේශ සැකසීම.
- ❖ අහදියා දහම් පාසල් නිල ඇඳුම් බෙදාදීම.
- ❖ අහදියා දහම් පාසල් ගුරුවරුන්ට පොත් දිමනාවක් ලබා දිම.
- ❖ හජ් වන්දනා කටයුතු සංවිධානය කිරිම.
- ❖ වාස විසා නිර්දේශ කිරිම.
- ❖ ආගම හා ආගමික ආයතන හා සම්බන්ධ පොත් පත් බඩු භාණ්ඩ සඳහා තීරුබදු සහන ලබා දීමට නිර්දේශ කිරිම.
- ❖ අරාබි විදුහල් වල තෝරාගත් සිසුන් ඊජිප්තුවේ අල් අස්හාර් විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යත්ව වැඩ සටහනකට යොමු කිරිම.
- ❖ රාමසාන් උපවාස සමයේදි මුස්ලිම් පල්ලිවලට හා බැතිමතුන්ට අවශ්‍ය රටඉඳි බෙදා හැරිමට ක්‍රියා කිරිම.

  උපවාස සමය තුල බැතිමතුන් වෙනුවෙන් සෞදි අරාබිය රාජ්‍යයෙන් මෙරටට පරිත්‍යාග කරන ලද රටඉඳි මෙට්‍රික් ටොන් 150 ක් දිස්ත්‍රික් මට්ටමින් මහ පල්ලි හරහා බෙදාහැරීමට කටයුතු කරන ලදී. මේ සඳහා මෙම දෙපාර්තමේන්තුව වෙත පුනරාවර්තන වියදම් යටතේ වෙන්කරන ලද රුපියල් මිලියන 21 ක ප්‍රතිපාදනය යොදාගන්නා ලදී. මෙම රටඉඳි ප්‍රමාණවත් නොවූ බැවින් ස.තො.ස. මගින් තවත් රටඉඳි මෙ.ටො. 250 ක් මිලදී ගෙන මුස්ලිම් ජනතාව අතර බෙදාදීමට කටයුතු කරන ලදී. මේ සදහා භාණ්ඩාගාරය විසින් රු.මි. 84 ක් වෙන්කර දෙන ලදී.

- ❖ **ජාතික මීලාදුන් නබි ජන්ම දින රාජ්‍ය උත්සවය පැවැත්විම.**

ලෝකවාසී මුස්ලිම් ජනතාව ඉතා භක්තියෙන් යුතුව සමරන ශුද්ධ වූ මුහම්මද් නබි (සල්) තුමාණන්ගේ ජන්ම දිනය 2018.11.20 වන දිනට යෙදි තිබූ අතර, එම රාජ්‍ය උත්සවය ජලසම්පාදන හා මුස්ලිම් ආගමික කටයුතු ගරු අමාත්‍ය එම්.එල්.ඒ.එම්. හිස්බුල්ලා මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2018.11.26 දින මරදාන සහිරා විද්‍යාලයේදී පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී.

❖ **ජාතික මිලාදුන් නබි ජන්ම දිනය නිමිත්තෙන් පළාත් හා ජාතික තරඟ පැවැත්වීම.**



වාර්ෂිකව පවත්වන මෙම උත්සවය නිමිත්තෙන් දිවයින පුරා පාසල් සිසු සිසුවියන් අතර කථික, කෙටි කථා, රචනා, පද්‍ය රචනා, ගායනා, අරාබි අක්ෂර මෝස්තර සහ අල්කුර්ආන් පාරායණය කිරීම යන ඉසව් යටතේ තරඟ පවත්වනු ලබයි. එක් එක් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල අධීක්ෂණය යටතේ පළාත් මට්ටමින් තරඟ පවත්වා එහි පළමු, දෙවන සහ තෙවන ස්ථාන ලබා ගන්නා තරඟකරුවන් සමස්ත ලංකා අවසාන මහා තරඟයට යොමුකරනු ලබයි. ජාතික මීලාදුන් නබි අවසන් මහ

| 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලියන) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය (රු. මිලියන) | 2018.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 3.465 | 3.216 | සමස්ත ලංකා අවසන් මහා තරඟය 2018 ඔක්තෝබර් මස 06,07 යන දිනයන්හිදී මරදාන සහිරා විදහලේදී සහ දෙපා.වේදී පවත්වන ලදී. ජයග්‍රහකයින් සඳහා තිළිණ 2018.11.26 දින ජාතික මීලාදුන් නබි උත්සවයේදී ගරු අමාත්‍යතුමාගේ අතින් පිරිනමන ලදි. |

තරගයෙන් ප්‍රථම ස්ථානය ලබා ගත් ජයග්‍රහකයන් 75 කු සඳහා තිළිණ හා සහතිකපත්‍ර මරදාන, සහිරා විදුහලේදී 2018.11.26 දින පැවැති ජාතික මීලාදුන් නබි උත්සවයේදී ගරු අමාත්‍යතුමා අතින් පිරිනමන ලදි. දෙවන හා තෙවන ස්ථාන දිනාගත් තරගකරුවන් 150කට ත්‍යාග හා සහතිකපත් ප්‍රදානය 2018.12.18 දින බම්බලපිටිය මුස්ලිම් බාලිකා විද්‍යාලයේදී පවත්වන ලදී.

❖ **වාර්ෂික කලාභූෂණ සම්මාන උලෙළ සඳහා මුස්ලිම් කලාකරුවන්ගේ නාම යෝජනා ඉදිරිපත් කිරිම.**

කලාකරුවන්ට ගෞරව, සත්කාර දැක්වීමට සහ ඔවුන්ව ඇගයීම පිණිස වාර්ෂිකව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව මගින් කලාභූෂණ රාජ්‍ය උත්සවය පවත්වන අතර මෙවර 2019 ජනවාරි මස 29 දින එම සම්මාන උළෙළ පවත්වන ලද අතර ඒ සඳහා සුදුසු මුස්ලිම් කලාකරුවන් නිර්දේශ කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබයි. මෙවර කලාකරුවන් 60 දෙනෙකුගෙන් අයදුම්පත් ලද අතර ඒ අතරින් 10 දෙනෙකුට සඳහා සම්මාන ප්‍රදානය කොළඹ 07 පිහිටි නෙලුම් පොකුණ රංග පීඨයේදී සිදුකරන ලදි. එම කලාකරුවන්ට ත්‍යාග පිරිනැමීමට රු.300,000 ක ප්‍රතිපාදන යොදාගන්නා ලදී.

❖ **මුහර්රම් දිනය**

ඉස්ලාමීය දින දර්ශනය අනුව මුස්ලිම් බැතිමතුන්ගේ අලුත් අවුරුද්ද ආරම්භ කරන්නේ මුහර්රම් මාසයෙනි. 2018 වසරේ මුස්ලිම් බැතිමතුන්ගේ අලුත් අවුරුදු උදාව සැප්තැම්බර් මස 19 දිනට යෙදී තිබුණි. දහම් පාසල් සිසුන්ගේ ආගමික වැඩසටහන් සමග මුහර්රම් දිනය

තැපැල් අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදි ගරු තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සමරන ලදි.

❖ **හජ් වැඩසටහන**



2018 වසරේ හජ් වන්දනා කටයුතු සඳහා සෞදි අරාබි රාජධානියේ මක්කම බලා යාමට ශ්‍රී ලාංකික බැතිමතුන් 3000 කට අවශ්‍ය කටයුතු මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදි. මෙම බැතිමතුන් වෙනුවෙන් පහසුකම් සලසා දීමට මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි හජ් යෝජිත ආයතන 95 ක්
වන්දනා ගමන සාර්ථක කර ගැනීම සඳහා තෝරා ගන්නා ලදි.

❖ **මුස්ලිම් ලේඛකයන් දිරිමත් කිරිම උදෙසා ඔවුන්ගේ ප්‍රකාශන මිලදි ගැනිම හා ඒවා මුස්ලිම් පාසල් පුස්තකාල වලට බෙදා හැරිම.**

මේ සඳහා පුනරාවර්ථන වියදම් යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන මිලියන 0.350 ක් යොදා ගත් අතර කතුවරුන් 35 දෙනෙකුගේ ග්‍රන්ථ ලබා ගන්නා ලදි.

❖ **ඉස්ලාමීය පූජකවරුන් (මවුලවිවරු) සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම**

2018 වර්ෂයේ දිවයින පුරා ඉස්ලාම් ආගමික පූජකවරුන් 230 දෙනෙකු සඳහා හැඳුනුම්පත් නිකුත් කර ඇත.

❖ **අල්කුර් ආන් තරඟ පැවැත්විම හා එමඟින් ජාත්‍යන්තර තරඟ සඳහා සුදුස්සන් තෝරා ගැනිම.**




ජාත්‍යන්තර අල් කුර්ආන් පාරායණය කිරීමේ ( කිරාත් සහ හිෆ්ලුල් කුරාන්) තරග සඳහා තේරීම් තරග කොළඹ 12, අල් හික්මා විදුහලේදී 2018 පෙබරවාරි මස 17 සහ 18 දිනවලදී පැවැත්වූ අතර ඉසව් 07 ක් යටතේ තරග කරන ලද ප්‍රථම ස්ථානය ලබා ගත් ජයග්‍රාහකයින්ට සහතික ප්‍රදානය ගරු තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය එම්.එච්.ඒ.හලීම් මැතිතුමාගේ ප්‍රදානත්වයෙන් 2018 අප්‍රේල් මස 12 දින තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශ ශ්‍රවණාගාරයේදී පවත්වන ලදි. ඒ අතරින් එක්සත් අරාබි එමීර් රාජ්‍යයට දෙදෙනෙකුද තුර්කි රාජ්‍යයට දෙදෙනෙකුද සෞදි අරාබි රාජ්‍යයට එක්අයෙකුද ඊජිප්තුවට එක් අයෙකුද යැවීමට තෝරා ගෙන ඔවුන් අදාල තරග සඳහා යොමු කරන ලදි.

❖ විවිධ රාජ්‍ය උත්සව අවස්ථාවන් සඳහා ඉස්ලාම් ආගමික පූජක නියෝජනය සම්බන්ධිකරණය හා අවශ්‍ය කටයුතු සම්පාදනය.

❖ **වාස වීසා ලබා ගැනීම සඳහා නිර්දේශ ලිපි නිකුත් කිරීම**

විදේශයන්හි සිට පල්ලි කටයුතු සඳහා පැමිණෙන පූජකවරුන්ට අරාබි විදුහල් කුර්ආන් මද්රසාවල ඉගැන්වීම් කටයුතු සඳහා පැමිණෙන ගුරුවරුන්ට සහ ශිෂ්‍යයන්ට මෙරට ගතකරන කාලසීමාව සඳහා වාස වීසා ලබා ගැනීමට අවශ්‍ය නිර්දේශ ලිපි නිකුත් කිරීමේ කටයුතු මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

❖ **කුර්ආන් මද්රසා සඳහා වන වැඩසටහන්**

කුර්ආන් මද්රසා 1680 ක් පමණ මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති අතර, මෙම වර්ෂයේදී නව කුර්ආන් මද්රසා 05 ක් ලියාපදිංචි කර ඇත. වාර්ෂිකව එක් මද්රසාවකට රු.6000.00 බැගින් තෝරාගන්නා ලද දුෂ්කර කුර්ආන් මද්රසා සඳහා පරිපාලන වියදම් පියවා ගැනීමට මුදල් ආධාර ප්‍රදානය කරනු ලැබේ. ඒ අනුව 2018 වසරේදී කුර්ආන් මද්රසා 200කට ආධාර ලබා දෙන ලදි.

| 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන ( රු . මිලියන ) | 2018.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය ( රු . මිලියන ) | 2018.12.31 දිනට භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 1.2 | 0.978 | 81.5% |

❖ **දහම් පාසල් සඳහා වන වැඩසටහන්**

මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි දහම් පාසල්වල ගුරුභවතුන් සඳහා වාර්ෂිකව නිල ඇඳුම් සහ පොත් දීමනාවක් ලබා දීම සිදු කෙරේ. මීට අමතරව දහම් පාසල් 6 ශ්‍රේණියේ සිට 9 ශ්‍රේණිය දක්වා විභාගයන්හී විෂය නිර්දේශයන්ට අනුකූලව සිංහල හා ඉංග්‍රීසි මාධයයෙන් සකසන ලද පෙළ පොත් 16ක් මුද්‍රණය සඳහා භාරදී ඇත. එසේම 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා දෙමළ මාධ්‍යයෙන් පෙළ පොත් සම්පාදනය කිරීමටද කටයුතු කර ඇත.

| | **2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මිලියන)** | **2018.12.31 දිනට ප්‍රගතිය** | |
|---|---|---|---|
| | | **භෞතික** | **මූල්‍ය (රු. මිලියන)** |
| I. නිල ඇඳුම් ලබාදීම. | 7.0 | දහම් පාසල් ගුරුවරුන් 4050 දෙනෙකු වෙත බෙදා හැරීම සඳහා නිල ඇඳුම් මිලදී ගන්නා ලදී. | 0.202 |
| II. පොත් දීමනාව | 21.2 | එක් ගුරුවරයෙකුට රු 5000 බැගින් දහම් පාසල් ගුරුවරුන් 4050 දෙනෙකු වෙත ලබාදී ඇත. | 20.065 |
| III. අහදියා දහම් පාසල් සඳහා විෂය නිර්දේශයන්ට අනුකූලව සකසන ලද පෙළ පොත් 26ක් මුද්‍රණය කිරීම | 6.0 | පරිවර්තනය කරන ලද පෙළපොත් 16 ක් මුද්‍රණය සඳහාද 10ක් සංස්කරණය සඳහාද භාරදී ඇත. | 4.89 |
| IV. අහදියා දහම් පාසල් ප්‍රශ්න පත්‍ර ඇගයීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසාදීම. | 0.4 | ඇගයීම් ජූලි මස සාර්ථකව සිදු කරන ලදී. | 0.361 |
| V. කුරාන් මද්රසා ජාතික විභාගය. | 3.0 | විභාගය නොවැම්බර් මස දෙපාර්තමේන්තුව විසින් පවත්වා ඇත. | 1.8 |

❖ **ආගමික සහජීවන දහම් පාසල් වැඩසටහන**

බුද්ධ ශාසන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව හින්දු ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, ක්‍රිස්තියානි කටයුතු දෙපාර්තමේන්තුව, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව ඒකාබද්ධව සියලු ආගම්වල සංස්කෘතික අංගයන් පිළිබඳව දරුවන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම හා සහජීවනය වර්ධනය කිරීමේ අරමුණින් දහම් පාසල් දරුවන් ගුරුවරුන් හා දෙමව්පියන් සම්බන්ධ කරගෙන වැඩසටහන් දෙකක් 2018 අගෝස්තු මස 10,11,12 යන දිනවදී කළුතර පස්දුන් රට අධ්‍යාපන විද්‍යාපීඨයේදී හා අගෝස්තු මස 17,18,19 යන දිනවලදී වේයන්ගොඩ, පත්තල ගෙදර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේදී අති සාර්ථක අන්දමින් පවත්වන ලදි. මේ සඳහා එක් වැඩසටහනකදී මෙම දෙපාර්තමේන්තුවෙන් කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 05ක්ද, දහම්පාසල් ගුරුවරුන් 10ක්ද, ශිෂ්‍ය ශිෂ්‍යාවන් 40ක්ද සමග අහදියා සම්මේලනයේ නිළධාරි මහතෙකුද බැගින් සහභාගීවන ලදී.

❖ **මිහ්රාජ් දිනය සැමරීම**

මුහම්මද් නබි නායක තුමාණෝ අල්ලාහ් බැහැදැකීම උදෙසා සිදු වූ රාත්‍රි ගමන **මිහ්රාජ් ගමන** ලෙස හඳුන්වනු ලබන අතර, එම අවස්ථාවේදී පස්වේල් සලාතය ( අල්ලාහ් නැමදීම) ත්‍යාගයක් ලෙස ලබා දෙන ලදි. මෙම අවස්ථාව සිහිකර මිහ්රාජ් දිනය සමරන අතර, මෙම වසරේ 2018 අප්‍රේල් මස 13 වැනි දින ගරු තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍ය එම්.එච්.ඒ.හලීම් ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් අකුරණ අස්නා ජුම්මා මහා පල්ලියේදී උත්සවශ්‍රීයෙන් සමරන ලදි.

❖ **පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ඉස්ලාමීය ආගමික අධ්‍යාපනය ප්‍රචලිත කිරීම හා සංවර්ධනය කිරීමේ අරමුණින් යාපනය හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල පල්ලි දායක සභාවන්හි සාමාජිකයන් සඳහා සම්මන්ත්‍රණය ඔක්තෝබර් හා නොවැම්බර් මසවල පවත්වන ලදි.

## 08. වකුෆ් හා පල්ලි පරිපාලන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්.

මුස්ලිම් පල්ලි හා පුණ්‍යාධාර අරමුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරමින් ඒ අනුව,

- දිවයිනේ සියළු දිස්ත්‍රික්කයන්හි මුස්ලිම් පල්ලි වල පරිපාලන කටයුතු කිරිම.
- මුස්ලිම් පල්ලි ලියාපදිංචි කිරිම.
- පල්ලි දායක සභාවල භාරකරුවන් පත්කිරීම.
- පල්ලිවල වාර්ෂික ගිණුම් වාර්තා ලබා ගැනීම හා පරීක්ෂා කර මුස්ලිම් පුණ්‍යාධාර භාර අරමුදලට දායක මුදල් ලබා ගැනිම හා අරමුදල පවත්වාගෙන යාම.
- මුස්ලිම් පල්ලි දායක සභාවල ගැටලු, අභියාචනා, පෙත්සම් සම්බන්ධිකරණය කීරිම, සමථයකට පත්කල නොහැකි ගැටලු වකුෆ් මණ්ඩලයට යොමු කිරීම

**වකුෆ් සභා කාර්යාලය**

නව පල්ලි 62 ක් හා පුණ්‍යාගාර 05 ක් මෙම වර්ෂයේදී ( 2018) ලියාපදිංචි කල අතර අභිනවයෙන් පත් වූ භාරකරුවන් සඳහා නව පත්වීම් 414 ක් ලබාදී ඇත. වකුෆ් සභාව විසින් විභාග කර ලබාදුන් තීරණයන්ට එරෙහිව වකුෆ් විනිශ්චය සභාවට ඉදිරිපත් කළ නඩු ගණන 10 කි. දැනට විභාග වෙමින් පවතින තීන්දු ලබා නොදුන් නඩු ගණන 34 කි. මහේස්ත්‍රාත් උසාවියට ඉදිරිපත් කල නඩු සංඛ්‍යාව 02 ක් වන අතර දිස්ත්‍රික් උසාවියට ඉදිරිපත් කල නඩු සංඛ්‍යාව 01 කි.

**වකුෆ් විනිශ්චය සභා කාර්යාලය**

අධිකරණ කොමිෂන් සභාව මගින් පත්කරන ලද සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විත වකුෆ් විනිශ්චය සභාවේ මාසික රැස්වීම් වාර ගණන 02කි. 2018 වර්ෂය සඳහා මුස්ලිම් පල්ලිවලින් ඉදිරිපත්වූ නඩු ගණන 10 කි. විභාග වෙමින් පවතින නඩු ගණන 05 කි. මින් 2017 වර්ෂයේදී ඉදිරිපත් වූ නඩු 03 කට හා 2018 ඉදිරිපත් කල නඩු 05 කට නියෝග ලබා දී ඇත.

## 09. ක්‍රියාත්මක කරන ලද විශේෂ වැඩසටහන්

### ❖ නිදහස් දින ජාතික උත්සවය

ජාතික නිදහස් උත්සවයට සමගාමීව පවත්වනු ලබන මුස්ලිම් ආගමික වතාවත් කොළඹ මහ පල්ලියේදී ගරු තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට කටයුතු කරන ලදී

### ❖ වෙනත් සංවර්ධන වැඩසටහන්

දෙපාර්තමේන්තුවේ සේවා කාර්යක්ෂම කිරීම අරමුණු කර ජාතික ඵලදායීතා ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි ඵලදායීතා වර්ධන වැඩසටහනක් ක්‍රියාවට නංවන ලදි.

## 10. අභ්‍යන්තර විගණන හා විමර්ෂන අංශය මඟින් ඉටු කරන ලද කාර්යයන්

දෙපාර්තමේන්තුවේ මූල්‍ය හා පාලන කටයුතු වල අභ්‍යන්තර පාලනය ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට අදාලව විගණනයන් සිදු කිරිම. එහිදි,

දෙපාර්තමේන්තුවේ ගිණුම් හා පරිපාලන කටයුතු පරීක්ෂා කර අඩුපාඩු පෙන්වා දී නිවැරදි කිරීමට කටයුතු කිරීම.

- ❖ එම අඩුපාඩු සකස් කර පවත්වාගෙන යාමට දෙපාර්තමේන්තුව කටයුතු කිරීම.
- ❖ විගණන විමසුම් වලට පිලිතුරු සැකසීම
- ❖ වාර්ෂික විගණනය සිදු කිරීම.

2018වර්ෂයට අදාල අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන විමසුම් සංඛ්‍යාව - 09

2018 වර්ෂයට අදාල රජයේ විගණකාධිපති විගණන විමසුම් සංඛ්‍යාව - 08

## 11. දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය කෙරෙහි වූ බාධාවන් සහ දුෂ්කරතා

**2018.12.31 දිනට දෙපාර්තමේන්තුවේ ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් පිළිබඳ සාරාංශය පහත පරිදි වේ.**

| | 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන | | 2018.12.31 දිනට මුළු වියදම | |
|---|---|---|---|---|
| | වාර්ෂික ඇස්තමේන්තුව (රු.) | මුළු ශුද්ධ ප්‍රතිපාදනය (රු.) | වියදම (රු.) | ප්‍රතිශතය |
| ප්‍රාග්ධන වියදම් | 59,700,000.00 | 59,700,000.00 | 47,701,852.53 | 79.9% |
| පුනරාවර්තන වියදම් | 91,000,000.00 | 248,200,000.00 | 233,789,150.43 | 94.19% |
| එකතුව | 150,700,000.00 | 307,900,000.00 | 281,491,002.96 | 91.42% |

ඉහත සඳහන් වැය විස්තර පරිදි දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය සතුටුදායක මට්ටමක පවතී. ඒ අනුව මූල්‍ය කාර්ය සාධන ප්‍රතිශතය 91.42% ක අගයක් පෙන්නුම් කරන බව සඳහන් කරමි. වෙනත් ප්‍රාග්ධන වියදම් යටතේ වත්කම් අත්පත් කරගැනීම් වැය විෂයන් වල ප්‍රතිපාදන ඉතිරිවීම් වලට හේතුව ඒ යටතේ ඉදිරිපත් වී ඇති මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථානය සඳහා ජෙනරේටරයක් මිලදී ගැනීමේ (රු.මි. 10.5) ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2018 ඔක්තෝබර් වල අමාත්‍යාංශ වෙනස් වීමත් සමග ඇණහිටීම සහ 2018.12.31 දිනට ගෙවීම් සඳහා ඉදිරිපත් කර තිබූ බිල්පත් (රු.මි. 9.7) නිරවුල් කිරීමට අක්මුදල් නිදහස් නොකිරීමය. 2019 වර්ෂයේ දී එයින් කොටසක් නිරවුල් කර ඇත.

දෙපාර්තමේන්තුවේ සියලුම මට්ටම් වල පුරප්පාඩු විශේෂයෙන් ම විධායක සේවා ශ්‍රේණියන්හී ඇති පුරප්පාඩු කාර්ය සාධන ඉලක්කයන් සපුරා ගැනීමට බාධාවක් විය.

ඉහත බාධක සහ දුෂ්කරතා මධ්‍යයයේ දෙපාර්තමේන්තුවේ අරමුණු, ඉලක්ක සාක්ෂාත් කර ගැනීම උදෙසා 2018 වර්ෂයේදී කටයුතු කරන ලද බව සඳහන් කරමි.

**වෙබ් අඩවිය** www.muslimaffairs.gov.lk

**විද්‍යුත් තැපැල** dir@muslimaffairs.gov.lk

info@muslimaffairs.gov.lk

**දුරකථන අංක** අධ්‍යක්ෂ - 011-2669994

කාර්යාලය - 011-2669997 / 011 -2667909

**ෆැක්ස් අංකය** 011-2692147